ඩාබිඳු සාමූහිකය
Dabindu Collective
வியர்வை துளிகளின் கூட்டமைப்பு

Reg. No. G A 659

2026.01.11

ප්‍රවෘත්ති අධ්‍යක්ෂ / කතෘ

විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය ආයතන වෙත,

හිතවත් ප්‍රවෘත්ති අධ්‍යක්ෂ / කතෘ තුමනි,

මාධ්‍ය ප්‍රකාශය

ඩාබිඳු සාමූහිකය වැරදි ලෙස අර්ථ නිරූපණය කිරීම හෙළා දකිමින් නිකුත් කරන ප්‍රකාශය

2026 ජනවාරි 08 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව තුළ, **පාර්ලිමේන්තු වරප්‍රසාද භාවිතා කරමින්**, ගරු දයාසිරි ජයසේකර මහතා විසින් **ඩාබිඳු සාමූහිකය (Dabindu Collective)** එහි පරමාර්ථයන් සහ මූල්‍ය සහය ප්‍රභවයන් පිළිබඳව සිදුකළ **අසත්‍ය,** වගකීම් විරහිත **හා නොමග යවන ප්‍රකාශය** අපි දැඩි ලෙස හෙළා දකිමු.

ඩාබිඳු සාමූහිකය පසුගිය **වසර 41ක් පුරා**, ශ්‍රී ලංකාවේ **වැඩකරන කාන්තාවන්ගේ අයිතිවාසිකම්**, විශේෂයෙන්ම සූරාකෑම, වෙනස්කොට සැලකීම සහ ව්‍යුහාත්මක වශයෙන් අසමානතාවයන්ට ලක්ව ඇති වැඩ කරන කාන්තාවන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා නීත්‍යානුකූලව සහ විනිවිදභාවයෙන් යුතුව **හා වගකීම් සහිතව** කටයුතු කරමින් සිටින සංවිධානයකි. අපගේ කටයුතු **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ව්‍යවස්ථාව**, ජාතික කම්කරු නීති සහ ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් මත පදනම් වේ

ඩාබිඳු සාමූහිකය අපකීර්තියට පත් කිරීමේ අරමුණින් විශේෂිත ප්‍රජාවකට පමණක් සේවය කරන සංවිධානයක් ලෙස ලඝු කොට දැක්වීම හෝ එක් සමාජ කණ්ඩායමක් සඳහා පමණක් කටයුතු කරන බවට හෝ එවැනි අර්ථයක් ඇති ලෙස අපගේ සංවිධානය නිරූපණය කිරීම සම්**පූර්ණයෙන්ම අසත්‍ය සහ අපහාසාත්මක කරුණක්** වන අතර අපි තරයේ එම ප්‍රකාශය ප්‍රතික්ෂේප කරමු. එවැනි ප්‍රකාශ හිතාමතාම වැරදි තොරතුරු ප්‍රචාරය කිරීමකට සමාන වන අතර නීතිය ඉදිරියේ සමානාත්මතාවය පිළිබඳ ව්‍යවස්ථාමය මූලධර්මයට ඍජු ලෙස එරෙහි වේ. එසේම, ඩාබිඳු සාමූහිකය වෙත ලැබෙන මූල්‍ය සහය පිළිබඳව, විශේෂයෙන් **Grassrooted Trust, Think Equal** සහ **Grassrooted Fund** ආශ්‍රිතව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී දයාසිරි ජයසේකර මහතා විසින් සිදුකළ ප්‍රකාශයද තවදුරටත් අපි දැඩි ලෙස ප්‍රතික්ෂේප කරමු. ඩාබිඳු සාමූහිකය විසින් ලබාගත් සියලු මූල්‍ය සහය **ශ්‍රී ලංකාවේ පවතින නීති හා නියාමන ක්‍රමවේදයන්ට අනුකූලව**, සම්පූර්ණයෙන්ම **නීතිමය, විවෘත සහ වගකීම් සහිතව** සිදු කර ඇත. පාර්ලිමේන්තුව තුළ සාක්ෂි හෝ නීතිමය ක්‍රියාවලියකින් තොරව මූල්‍යාධාර ආයතන නාම සඳහන් කරමින් අර්ථගත සැකයක් නිර්මාණය කිරීම **සිවිල් සමාජ සංවිධාන අගෞරවයට ලක් කිරීමේ හා** මහජන සැකය ඇති කිරීමට දරන **උත්සාහයක්** වේ. **පාර්ලිමේන්තු වරප්‍රසාදය** යනු නිදහස් ව්‍යවස්ථාමය විවාදයට ආරක්ෂාවක් ලබාදීමට ඇති සම්පාදනයක් වන අතර, **අසත්‍ය චෝදනා, දූස් තොරතුරු හෝ සිවිල් සමාජ සංවිධාන ඉලක්ක කරගත් ප්‍රහාරයන්ට ආවරණයක් ලෙස භාවිතා කළ නොහැකි** ය.

Address : Dabindu Collective, 221, Welabada Road, Katunayake, Sri Lanka Email :dabindu.infoco@gmail.com Tel : 0114851383 / 0777259892

වගවීම මග හැරීමට, වෙනස්කම් කිරීමට පෙළඹවීමට හෝ සිවිල් සමාජ ක්‍රියාකාරීන් බිය ගැන්වීමට යාන්ත්‍රණයක් ලෙස පාර්ලිමේන්තු වරප්‍රසාද භාවිතා කළ නොහැක. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් රාමුව යටතේ සිවිල් සමාජ සංවිධාන වෙත **ප්‍රකාශනයේ නිදහස, සංවිධානය වීමේ නිදහස** ආරක්ෂා කර ඇත.

ජාතික අර්බුද මධ්‍යයේ වුවද, තර්ජන සහ බිය ගැන්වීම් නොතකා ඩාබිඳු සාමූහිකය සිය කටයුතු කරගෙන ගොස් ඇත. **COVID-19 වසංගත සමයේ**, නිරෝධායන මධ්‍යස්ථානවල සිදු වූ සේවක හිංසාවන්, අසාධාරණ පරිපාලන ක්‍රියා සහ අයිතිවාසිකම් උල්ලංඝනයන් පිළිබඳව ඩාබිඳු සාමූහිකය නීතිමය ලෙස හඬ නැගූ අවස්ථාවන්හිදී, අපගේ නිලධාරීන්ට **ඍජු තර්ජන සහ බිය ගැන්වීම්** එල්ල විය. එම තීරණාත්මක අවස්ථාවේදී, සිවිල් සමාජ සහයෝගීතාවය මානව හිමිකම් ක්‍රියාදරයන් ආරක්ෂා කිරීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කළේය. අද පවා, සිවිල් සමාජ සංවිධාන, ව්‍යාපාර සහ ප්‍රගතිශීලී ක්‍රියාකාරීන්ට යුක්තිය, සමානාත්මතාවය සහ වැඩ කරන කාන්තාවන්ගේ ආරක්ෂාව සඳහා කටයුතු කරන ආයතන සමඟ සහයෝගීතාවයෙන් සිටීමට සාමූහික වගකීමක් ඇත. ශ්‍රී ලංකාවට කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීමේ සම්මුතිය (CEDAW), මූලික ILO සම්මුතීන් සහ මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනය වැනි ජාත්‍යන්තර මෙවලම් යටතේ බැඳීම් ඇති අතර, ඒවා මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම සඳහා සම්පත් සෙවීමට, ලබා ගැනීමට සහ භාවිතා කිරීමට සංවිධානවලට ඇති අයිතිය පැහැදිලිව පිළිගනී. නීත්‍යානුකූල සිවිල් සමාජ අරමුදල් අපකීර්තියට පත් කිරීමට දරන උත්සාහයන් මෙම බැඳීම්වලට පටහැනි වන අතර ප්‍රජාතන්ත්‍රවාදී වගවීම දුර්වල කරයි.

මානව හිමිකම් කටයුතු සදාචාරාත්මක භීතිය, වෙනස්කම් කිරීම හෝ මූල්‍ය සැකය සමඟ පටලවා ගැනීමට දරන උත්සාහයන් මානව හිමිකම් ක්‍රියාදරයින් අවදානමට ලක් කරන සහ නීතියේ ආධිපත්‍යය අඩපණ කරන භයානක පූර්වාදර්ශයක් ස්ථාපිත කරයි.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්, ඩබිඳු සාමූහිකය ඉල්ලා සිටින්නේ:

1. පාර්ලිමේන්තුවේදී කරන ලද නොමඟ යවන ප්‍රකාශ වහාම ඉල්ලා අස්කර ගැනීම
2. සිවිල් සමාජ සංවිධාන සහ මානව හිමිකම් ආරක්ෂකයින් ඉලක්ක කිරීම, බිය ගැන්වීම සහ වැරදි ලෙස නිරූපණය කිරීම අවසන් කිරීම
3. ව්‍යවස්ථාමය නිදහස සහ සිවිල් සමාජ අවකාශය ආරක්ෂා කිරීම සඳහා ඇති කැපවීම පිළිබඳව පාර්ලිමේන්තුව විසින් නැවත තහවුරු කිරීම

ප්‍රජාතන්ත්‍රවාදී සම්මතයන් ආරක්ෂා කරන ලෙස, පාර්ලිමේන්තු වරප්‍රසාද අනිසි ලෙස භාවිතා කිරීමට එරෙහි වන ලෙස සහ යුක්තිය සහ සමානාත්මතාවය සඳහා වැඩ කරන සංවිධාන සමඟ සහයෝගීතාවයෙන් සිටින ලෙස අපි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන්, ව්‍යවස්ථාපිත ආයතනවලින්, සිවිල් සමාජ සංවිධානවලින්, ව්‍යාත්තීය සම්තිවලින් සහ ප්‍රජාතන්ත්‍රවාදී ආයතනවලින් ඉල්ලා සිටිමු. ඩාබිඳු සාමූහිකය ව්‍යවස්ථාමය ප්‍රජාතන්ත්‍රවාදය, කම්කරු යුක්තිය, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ මූලික අයිතිවාසිකම් සඳහා වන කැපවීමෙහි ස්ථිරව සිටී. අඛණ්ඩව දශක හතරකට වැඩි කාලයක් අපගේ ක්‍රියාකාරීත්වය, බියෙන් හෝ සම්මුතියකින් තොරව දිගටම කරගෙන යන්නෙමු.

Address : Dabindu Collective, 221, Welabada Road, Katunayake, Sri Lanka Email :dabindu.infoco@gmail.com Tel : 0114851383 / 0777259892